www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී ජාත්‍යන්තරවාදය සහ සංක්‍රමනික කම්කරුවන්ගේ ආරක්ෂාව

## Socialist internationalism and the defense of immigrant workers

2010 මැයි 4

සංක්‍රමනිකයන්ව පොලිස් දඩයමට ලක්කිරීම ඉලක්ක කරගනිමින් පසුගිය මාසයේ ඇරිසෝනා ප්‍රාන්තය බලාත්මක කල නීතියක් එක්සත් ජනපදයේ ජීවත්වන ලැයිස්තු ගත නො කල කම්කරුවන් මිලියන 12ක තත්වය පිලිබඳව මාධ්‍යයන් සහ සංස්ථාපිතයේ දේශපාලන කවයන් තුල යලි වතාවක් විවාදයක් අවුලුවා ඇත. මෙම විවාදය බොහෝ සෙයින් කේන්ද්‍රගතව ඇත්තේ සමස්ත එක්සත් ජනපදය පුරා වැඩකරන ජනතාවන් මුහුන පා සිටින ඉහල යන විරැකියාව, ඇදවැටෙන සැබෑ වැටුප් මට්ටම් සහ තියුනු ලෙස බාදනය වන ජීවන කොන්දේසි පිලිබඳ වරද කම්කරු පන්තියේ වඩාත් ම පීඩිත කොටස් වන සංක්‍රමනිකයන් මත පැටවීමට ය.

ඇරිසෝනා නීතිය ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කරන අතර ම, ඔබාමා පරිපාලනය සහ ඉදිරි පෙල ඩිමොක්‍රටික කොංග්‍රස් සභිකයෝ එක්සත් ජනපද-මෙක්සිකානු දේශසීමාව වඩ වඩා මිලිටරිකරනය කිරීම සහ එක්සත් ජනපදය තුල ජීවත් වන ලැයිස්තු ගත නො කල කම්කරුවන්ට අපරාධ පිලිබඳ වරද පිලිගැනීමට ත් නෛතික තත්වය ඉල්ලා සිටින අයගේ පෝලිමේ "පසුපසින් සිටීමට" පෙර අධික දඩ ගෙවීමට බලකිරීම ත් සමගින් සංක්‍රමනික කම්කරුවන්ට වඩ වඩා දඬුවම් දීම අවධාරනය කරමින් සංක්‍රමනය පිලිබඳ තමන්ගේ ම පිලිවෙත්වලින් වඩ වඩා දකුනට හැරීමට එය භාවිතා කර ඇත. එයට අමතරව ඩිමොක්‍රටිකයෝ රැකියා ලබාගැනීම සඳහා ජීවමිතික ජාතික හැඳුනුම්පතක් හඳුන්වාදීමට බලකරන්නේ ජාතික සහ සංක්‍රමනික යන කම්කරු පන්තියේ සියලු ම කොටස්වලට එරෙහිව භාවිතා කිරීමට බලගතු පොලිස් රාජ්‍යමය අවියක් ආන්ඩුවට ලබා දෙමිනි. මැයි 1 දා රටපුරා නගරවල වීදිවලට සංක්‍රමන විරෝධී මර්දනය අවසන් කිරීම සහ සියලු දෙනාට පූර්න සහ සමාන අයිතීන් ඉල්ලා සිටින සිය දහස් ගනන් දෙනා කැඳවූම් කරමින් පක්ෂ දෙකේ ම මෙම ප්‍රතිගාමී හැරීම තියුනු විරුද්ධත්වයක් අවුලුවා ඇත.

සංක්‍රමන-විරෝධී ස්වෝත්තමවාදය හුදෙක් එක්සත් ජනපදයේ පමනක් නොව ලෝකයේ සෑම රටක ම පාලක ප්‍රභූවේ ද එහි අවශ්‍යතා ආරක්ෂා කරන දක්ෂිනාංශක වාචාලයන්ගේ ද හස්තයෙහි ඇති දේශපාලන අවියකි. ප්‍රසිද්ධියේ බූර්කාව හෙවත් සමස්ත මුහුන ආවරනය කරන වැස්ම පැලඳීම තහනම් කිරීම ඉදිරියට දැමීම හරහා ප්‍රන්ස ආන්ඩුව මුස්ලිම් සංක්‍රමනිකයන්ට එරෙහිව මහජනයා යොමු කිරීමට ප්‍රයත්න දරා ඇත. බෙල්ජියම දැනටමත් එවැනි තහනමක් ක්‍රියාත්මක කොට ඇත. බ්‍රිතාන්‍යය තුල වෘත්තීය සමිති විදෙස් ශ්‍රමයට එරෙහිව වැඩවර්ජන සංවිධානය කර ඇත. ඉතාලියේ සංක්‍රමන-විරෝධී කැරලි පැවත තිබෙන අතර හංගේරියාව තුල අභිකුන්ඨික සුලුතරයට එරෙහිව කෝලාහල අවුලුවාලීමේ ප්‍රයත්න දැකගෙන තිබේ.

මෙම සංක්‍රමන-විරෝධී ආක්‍රමනශීලීත්වයේ සුවිශේෂී වංචනික රූපාකාරයක් වන්නේ අඩු වැටුප් තරගකාරීත්වයට එරෙහිව ස්වදේශීය කම්කරුවන්ගේ කොන්දේසි ආරක්ෂා කිරීමේ නාමයෙන් සංකමනිකයන් මත කඩාපැනීමට සහ දේශසීමාව තරකිරීමට දරන ප්‍රයත්නය යි.

හරියට ම මෙම ආස්ථානය පිලිබිඹු කරමින් මෑත සති කිහිපය තුල ඇරිසෝනා නීතිය සහ මැයි 1 උද්ඝෝෂන පිලිබඳව අපගේ ප්‍රකාශනවලට ප්‍රතිචාර දක්වමින් ලෝක සමාජවාදී වෙබ් අඩවිය වෙත ඊමේල් පනිවුඩ ගනනාවක් ලැබී ඇත. "ඔබ ඇමරිකානු කම්කරු පන්තිය නියෝජනය නො කරති" යයි එක් පාඨකයෙක් අදහස් දක්වයි. "ක්ෂනිකව ගිලෙමින් තිබෙන - සමහරවිට බිඳවැටෙමින් තිබෙන - ආර්ථිකයක් සහ දෘෂ්ටි පථයට ආසන්න බහුවිධ සම්පත් අර්බුදයක් මධ්‍යයේ ජනගහන වර්ධනය සහ වහල් වැටුප් ශ්‍රමය ඉතිරියාම වැලැක්වීමට යම්කිසි දෙයක් කල යුතු ය."

"ලැයිස්තුගත නො කල කම්කරුවන් විශාල ප්‍රමානයෙන් පැමිනීම 20වන ශතවර්ෂය තුල එක්සත් ජනපද කම්කරුවන් දිනාගත් ජයග්‍රහන විනාශ කිරීමට යයි" යනුවෙන් තවත් පාඨකයෙක් අදහස් දක්වයි. "මා ආන්තිකව දිලිඳු ලතින් ඇමරිකාවේ ජනතාවගේ ඉරනම සම්බන්ධයෙන් අනුකම්පා සහගත වන අතර ම ලෝකයේ කිසිදු ජාතියක් විදේශිකයන් - වඩාත් තත්වාරක්ෂක ගනනය කිරීම්වලට අනුව 'නීති විරෝධීන්' මිලියන 11ක් - නිර්බාධිතව ගලා ඒමට සරලව

දොර විවෘත නො කරන බව සඳහන් කල යුතු ය. විශාල ව්‍යාපාරවලට සහ කර්මාන්තවලට නීති විරෝධී විදේශිකයන්ට රක්ෂන සහ අනෙකුත් ප්‍රතිලාභ නො ගෙවා ඒවායින් ගැලවී අඩු වැටුප් (බොහෝ විට අවම වැටුපටත් අඩුවෙන්) ගෙවිය හැකි නිසා එක්සත් ජනපදය එහි නීතිය බලාත්මක කිරීමට අසමර්ථව ඇත."

ලැයිස්තුගත නො කල සංක්‍රමනිකයන් සඳහා වන එකිනෙකට වෙනස් මට්ටම්වලින් ප්‍රකාශිත අනුකම්පාව පසෙක තිබියේවා මෙම සියලු චර්චාවන්ට පොදු අදහස වන්නේ එක්සත් ජනපද දේශසීමා රැකවල් තරකිරීමට සහ සංක්‍රමනිකයන් එලවා දැමීමට රාජ්‍යයේ බලය තියුනු කිරීම හරහා ජාතික ශ්‍රම ප්‍රමිතීන් දිරිගැන්වීම මගින් එක්සත් ජනපදය තුල කම්කරුවන්ගේ කොන්දේසි ආරක්ෂා කරගත හැකිය යන්න යි. එක්සත් ජනපද මහ ව්‍යාපාරිකයට සංක්‍රමනික කම්කරුවන්ව ලාභ ශ්‍රමිකයන් ලෙස සූරාකෑමේ හැකියාව නිසා සංක්‍රමනික ප්‍රශ්නය මත එය අවම වසයෙන් ගැඹුරින් ඉරිතලා ගොස් ඇතැයි ප්‍රතික්ෂේප කල නො හැකි චෝදනාව සමග මෙය සම්බන්ධ කරනු ලැබේ.

19 වන ශතවර්ෂයේ අයර්ලන්ත සහ ජර්මානු කම්කරුවන්ට එරෙහි සහ 20 වන ශතවර්ෂයේ ඉතාලි, නැගෙනහිර යුරෝපීය සහ චීන කම්කරුවන්ට උද්ඝෝෂන සමගින් එක්සත් ජනපදය තුල සංක්‍රමන විරෝධී ආක්‍රමනශීලීත්වයට දීර්ඝ සහ කැත ඉතිහාසයක් තිබේ. එම සෑම අවස්ථාවක ම එම උද්ඝෝෂනවල ඉලක්කය වූයේ කම්කරු පන්තිය බෙදීම, බොහෝවිට සංක්‍රමනිකයන්ගෙන් ද සැදුම් ලත් එහි වඩාත් ම සටන්කාමී කොටස් මැඩීම සහ සමාජ අරගල මෙල්ල කිරීම සහ මර්දනය කිරීම යි.

ලෝසවෙෂ වෙත එවා ඇති මෙම ලිපි තුල ප්‍රකාශිත ජාතිකවාදී දැක්ම සහ "විදේශීය" තර්ජනයක් යයි කියන දෙයින් ඇමරිකානු කම්කරුවන්ගේ කොන්දේසි ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජනපද ආන්ඩුවට කෙරෙන ආයාචනා එක්සත් ජනපද කම්කරු නිලධරයේ සහ එය වටා ආකර්ෂනය වී සිටින විවිධාකාර මධ්‍යම පන්තික "පලමුව ඇමරිකාව" යන දේශපාලනයට සමීපව අනුරූප වේ.

තුනී මූල්‍ය ප්‍රභූ තන්ත්‍රයක් විසින් ගෝලීය ධනය ඒකාධිකාරී කිරීම මගින් නිර්මානය කරන ලද හිඟයන් වෙනස් කිරීමට කිසිවක් කල නො හැකි ය යන්නෙන් ඇරඹෙන මෙම තර්ක, ප්‍රතිඵල වී ඇති කාලකන්නි භාවය සංක්‍රමනික කම්කරුවන්ව එලවා දැමීම මගින් හොඳ අතට හරවා ගත හැකි ය යන විශ්වාසය ඉදිරියට දමන බව පෙනේ.

ඒඑෆ්එල්-සීඅයිඕ විසින් ඉදිරියට දමනු ලබන ස්වොත්තමවාදී පිලිවෙත් රැකියා, වැටුප් සහ සේවා කොන්දේසි විනාශ කිරීම පැටවීමේ උපක්‍රමයකට වැඩි යමක් නො වේ. එක්සත් ජනපද අන්තර් ජාතික සංගත නිෂ්පාදනය ගෙන ගොස් ඇති චීනය, නැගෙනහිර යුරෝපය, මෙක්සිකෝව සහ ලෝකයේ අනෙකුත් ප්‍රදේශවල ශ්‍රම වියදම් සමග එක්සත් ජනපදය තුල එම වියදම් වඩා තරගකාරී කිරීමේ ඉලක්කය ඇතිව කෙරෙන වැටුප් කප්පාදු කිරීම්, මහා පරිමාන දොට්ට දැමීම් සහ ව්‍යාපාරික සහන පැටවීම මගින් "ඇමරිකානු රැකියා" ආරක්ෂා කිරීමට වෘත්තීය සමිති නිලධරය දිවුරා සිටී. ඇමරිකානු කම්කරු පන්තියේ තත්වය පිරිහීමට අඩු-ශ්‍රම සංක්‍රමනික කම්කරුවන් ගලාඒම වගකිව යුතු ය යන අදහස එම සන්තතියේ සත්‍ය ඉතිහාසය මගින් ප්‍රතික්ෂේප කෙරේ. ධනවාදය පෙර නුවූ විරූ ලෙස ගෝලීයව ඒකාග්‍ර වීම නිෂ්පාදනය තර්කාපනය කිරීමේ සහ එක්සත් ජනපදයේත් සමස්ත ලෝකය පුරාත් වැටුප් පහල දැමීමේ හැකියාව ලබා දුන්නේ ය. 20වන ශතවර්ෂය තුල සංක්‍රමනය තීව්‍ර වීම මෙම සන්තතියේ නිෂ්පාදිතයක් මිස එහි හේතුව නො වන අතර වඩාත් පීඩිත රටවල් මත එහි සුවිශේෂී බලපෑම පිලිබඳ සාක්ෂියක් වන්නේ එහි අවම එක නො වන මෙක්සිකෝවේ ගොවි කෘෂිකර්මය විනාශ කිරීම යි.

එක්සත් ජනපදය තුල රැකියා සහ සේවා කොන්දේසි විනාශ කොට ඇත්තේ වඩ වඩා භයානක සහ මිලිටරීකෘත දේශසීමාවක් තරනය කිරීමේ දී සිය ජීවිතය පරදුවට තැබීමට බල කෙරී ඇති සංක්‍රමනික කම්කරුවන් නො වේ. ඒ වෙනුවට ඒ සඳහා වගකිව යුතු වන්නේ සංගත සහ මූල්‍ය ප්‍රභූවේ ලාභ අවශ්‍යතා සඳහා ලෝක ආර්ථිකය යටපත් කරන සහ ලාභ ශ්‍රමය සොයා එක් රටක සිට තවත් රටකට ක්ෂනිකව පීරා යාමේ දී ප්‍රාග්ධනයට ගමන් බලපත් අවශ්‍ය නො වන ධනේශ්වර පද්ධතිය යි.

එක්සත් ජනපදයේ වේවා වෙනත් රටක වේවා කම්කරුවන්ට ගෝලීය වසයෙන් චලනයේ යෙදෙන ප්‍රාග්ධනයට එරෙහිව සාර්ථකව අරගල කල හැක්කේ ත් ලෝක ආර්ථික අර්බුදයට තමන්ගේ ම ස්වාධීන විසඳුමක් - එනම් පෞද්ගලික ලාභය නොව සමාජ අවශ්‍යතාව සඳහා ගෝලීය ආර්ථිකය ප්‍රතිසංවිධානය කිරීම - ඉදිරිපත් කල හැක්කේ ත් ජාත්‍යන්තරව කම්කරු පන්තිය සමග එකමුතු වීමෙන් පමනි. මෙම එක්සත් භාවය ආරම්භ විය යුත්තේ ඔවුන්ගේ නීතිමය තත්වය නො තකා ස්වදේශීය සහ සංක්‍රමනික බෙදීමට දැරෙන සියලු ප්‍රයත්න ප්‍රතික්ෂේප කරමින් සහ සියලු කම්කරුවන්ට සම්පූර්න සහ සමාන අයිතිවාසිකම් සමගින් තමන් කැමති රටක ජීවත් වීමට සහ වැඩකිරීමට ඇති නිදහසට ආධාර කිරීමෙනි. එක්තරා "ඇමරිකානු බලකොටුවක්" නිර්මානය කිරීම සඳහා ශක්තිමත් ජාතික දේශසීමා, ආර්ථික ආරක්ෂනවාදය සහ තද සංක්‍රමන නීති මත පදනම් වීම දේශීය වසයෙන් කම්කරු පන්තිය මත ප්‍රහාර තීව්‍ර කිරීම පමනක් කරනු ඇත්තේ ගෝලීය අධිරාජ්‍යවාදී යුද්ධයේ නව පුපුරායාමකට මග පාදමිනි.

එක්සත් ජනපදයේත් සෑම රටකමත් කම්කරුවන්ට එවැනි ව්‍යසනයක් වැලැක්විය හැක්කේ ලෝක ආර්ථිකය විප්ලවීය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීමට කරන පොදු අරගලයක් හරහා පමනි. ඒ සඳහා ලෝක සමාජවාදී විප්ලවයේ පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැගීම අවශ්‍ය කෙරේ.

බිල් වෑන් ඕකන්

© www.wsws.org